**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විරුද්ධව හිජාස් ඔමර් හිස්බුල්ලා සහා සලීම්කාන් මොහොමඩ් ශාකීල්* (පාස්කු ප්‍රහාරය හා එහි පසුබිම් සිදුවීම් සබැඳිව ගොණු කරන ලද නඩුවකි.)

**Case no (නඩු අංකය):** HC 78/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2022 නොවැම්බර් මස 25 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | නදී අපර්ණා සුවන්දුරුගොඩ විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්<br><br>නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම<br><br>නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන් ද සිල්වා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. හිජාස් ඔමර් හිස්බුල්ලා<br><br>2. සලීම්කාන් මොහොමඩ් ශාකීල් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | පළමු චූදිත වෙනුවෙන් පෙනී සිටීම් පෙර පරිදිම බව දන්වා සිටින ලදී.කෙසේ නමුත් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස මහතා මෙදින පැමිණ නොසිටියේය.<br><br>දෙවන චූදිත වෙනුවෙන්ද පෙනී සිටීම පෙර පරිදිම බව දන්වා සිටින ලදී. නීතිඥ චමින්ද අතුකෝරල මහතා විසින් දෙවන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම සිදු කරන ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, නීතිඥ සංගමයෙන් නීතිඥ රංජන් පෙරේරා මහතා පැමිණ සිටියේය, විදේශිකයන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා 2022.10.14 දින කාර්ය සටහනේ 3 වන පිටුවේ ආරම්භයේ 2 වන චූදිත වෙනුවෙන් පෙනී සිටින "ජනාධිපති නීතිඥ" යන්න වෙනස් විය යුතු බවට දන්වා "ජනාධිපති" යන්න ඉවත් විය යුතු බව දන්වා සිටින ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1 වූ මොහොමඩ් නසාර් මොහොමඩ් මලික්ගෙන් දෙවන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා හරස් ප්‍රශ්න ඇසීම මෙදින සිදු විය. මෙහිදී අවශ්‍ය අවස්ථා වලදී ද්‍රවිඩ භාෂා පරිවර්තන අවස්ථාවක් ලබා දෙන බවට අධිකරණය දන්වා සිටින ලදී.

මෙදින හරස් ප්‍රශ්න ඇසීමේදී පාර්ශවයන්ගේ නීතිඥවරුන් සහ විනිසුරුතුමිය යම් යම් කරුණු සාකච්ඡා කිරීම් සිදු කරන ලද අවස්ථාවන්ගේදී සාක්ෂිකරුව විටින් විට අධිකරණ ශාලාවෙන් පිටතට යැවීමක් සිදු කරන ලදී.

හරස් ප්‍රශ්න අසමින් නීතිඥ මහතා සාක්ෂිකරුගෙන් පහත කරුණු විමසන ලදී. එහිදී සාක්ෂිකරු අල්සුහයිරියා පාසලෙන් පැන ගිය බව පවසන ලදී යනුවෙන් දක්වමින් කරන ලද ප්‍රශ්න කිරීම් හමුවේ සාක්ෂිකරු සඳහන් කරන ලද්දේ, පාසලේ සිට 500m ක් 700mක් පමණ පයින් ඇවිද පුත්තලමට පැමිණි බවත්, කොළඹට නැග්ග බවත්ය. ඒ සඳහා අවශ්‍ය මුදල් ලැබුණු ආකාරය ලෙස සඳහන් කරන ලද්දේ, ඊට පෙර දින රට ඉඳන් පිරිසක් පැමිණ රට ඉඳි සහ මුදල් දුන් බවයි. එමෙන්ම ඔහු පැන යන බව ෆවුසාන්, ෆාසිල් ආදී පිරිසක් දැන සිටි බවද සාක්ෂිකරු සඳහන් කරන ලදී.

තවදුරටත් නීතිඥ මහතා කරන ලද ප්‍රශ්න කිරීම් හමුවේ සාක්ෂිකරු සඳහන් කරන ලද්දේ, පාසලේ ඉදිරිපස ගේට්ටුව තිබුණද, වටේ තාප්පයක් නොතිබූ බවයි. වටේ තිබූ තහඩු වලින් රිංගලා මෙසේ පැන යාම සිදු කරන ලද බවද, නේවාසිකාගාරයේ සිට 5m පමණ දුරක් ගේට්ටුවට තිබූ බවද, ගේට්ටුව අසල මුරකරුවකු නොසිටි බවද සඳහන් කරන ලදී. සාක්ෂිකරුගේ ඇඳුම් පාසලේ තබා පැන ගිය බවද සඳහන් කරන ලදී. අනිත් ළමුන්ගේ මස් කැල්ලක් හැංගීම හා සම්බන්ධව සාක්ෂිකරුගේ අත් බැඳ පහර දුන් බවටත්, වේලාවට පල්ලි නොගිය විට දඬුවම් විඳීමට සිදු වූ බවද සාක්ෂිකරු සඳහන් කරන ලදී. සාක්ෂිකරු විසින් පැන ගියේ ආපසු පාසලට ඒමට නොවන බවටත් දක්වන ලදී. එමෙන්ම සාක්ෂිකරුගේ සාක්ෂි හමුවේ අනාවරණය වූයේ, දෙසැම්බර් නිවාඩුවට ගොස් පැමිණ 2019 වර්ෂයේ ජනවාරි අන්තිම වගේ පාසලෙන් පැන ගිය බවයි.

කොටුව මහේස්ත්‍රාත් තුමන් ඉදිරිපිට සාක්ෂිකරු දෙන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීම සිදු කරන ලදී. එහිදී සාක්ෂිකරු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මහත්වරුන් මහේස්ත්‍රාත්තුමන් ළඟට යාමට පෙර සාක්ෂිකරු සමඟ කතා කළ බවටත්, වෙච්ච දේ පවසන ලෙස පැවසූ බවටත් සාක්ෂි දෙන ලදී. 2020 වර්ෂයේ

මැයි මස 12 වන දින සාක්ෂිකරු විසින් කොටුව මහේස්ත්‍රාත්තුමන් ඉදිරියේ කරන ලද ප්‍රකාශ ඇතුලත් ලේඛන මුද්‍රා තබා තිබූ අතර මුද්‍රා ඉවත් කර ලේඛන ඉවතට ගන්නා ලදී. සාක්ෂිකරුට අදාළ ප්‍රකාශයේ අග වම්පස ඇති අත්සන පෙන්වා සිටින ලදී. එම අත්සන සාක්ෂිකරු පිළිගන්නා ලදී. මෙහිදී කොටුව මහේස්ත්‍රාත්තුමන්ට දෙන ලද ප්‍රකාශයේ සඳහන් කරුණු වල සහ සාක්ෂිකරු මෙම අධිකරණයේදී ප්‍රකාශ කළ කරුණු වල යම් යම් වෙනස් තත්වයන් ඇති බවට 2 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා පෙන්වා සිටිමින් එම ප්‍රකාශයන්ගෙන් නිවැරදි කුමක්ද යන්න විමසන ලදී. ("නිවාඩුවට ආවට පස්සේ මම ආයේ හොස්ටල් එකට ගියේ නැහැ.") (දෙසැම්බර් නිවාඩුවට ගිහිල්ලා මාසයක් විතර ගෙදර ඉඳලා ඇවිත් දවස් දෙකකින් විතර පැනලා ගියේ යනුවෙන් මෙම අධිකරණයේදී සඳහන් කරන ලදී.) එහිදී මෙම අධිකරණයේදී මෙදින ප්‍රකාශ කරන ලද්ද නිවැරදි බව විත්තිකරු ප්‍රකාශ කරන ලදී. මෙම අධිකරනයේදීම සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ පැනලා ආපසු, නැවත අල්සුහයිරියා පාසලට නොගිය බවයි. කෙසේ නමුත් opening ceremony එකට පාසලට ගිය බව සාක්ෂිකරු සඳහන් කරයි. එහිදී හරස් ප්‍රශ්න හමුවේ පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ, පැය 4ක් හෝ 5ක් සිටින්නට ඇති බවටත්, එවැනි යමකට ගිය විට ගහන්නේ නැති බවත්ය. පැනලා ගොස් දඹුල්ල නේවාසිකාගාරයේ නැවතී සිට ආපසු පාසලට යන ලද බව සාක්ෂිකරු පිළිගන්නා ලදී.

2020.04.20 දින  අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) නිලධාරීන් නිවසට පැමිණ කට උත්තරයක් ගත් බවටත්, ඉන්පසු දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ගොස් කටඋත්තරයක් දුන් බවටත් සාක්ෂිකරු හරස් ප්‍රශ්න හමුවේ සාක්ෂි දෙන ලදී.

2020.09.24 දින කොළඹ අපරාධ කොට්ඨාශයට (CCD) සාක්ෂිකරු දෙන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන්ද දැක්වීය. CCD Unit 5 නම් තොරතුරු පොතේ 74 පිටුවෙහි හි ඇති සාක්ෂිකරුගේ අත්සන පෙන්වා සිටී. සාක්ෂිකරු එය තමන්ගේ අත්සන බවට හඳුනාගන්නා ලදී. මම නිවසේ සිටින විට 2020.03.20 දින CID එකෙන් මගෙන් කටඋත්තරයක් අරන් ගියා යනුවෙන් සාක්ෂිකරුගේ ප්‍රකාශයේ වූ කොටසක් මෙහිදී නීතිඥතුමන් දක්වන ලදී. මෙම අවස්ථාවේදී 1 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා මෙම සාක්ෂියේදී අනාවරණය වූ 2020.03.20 CIDයට යන්න හා සබැඳිව හරස් ප්‍රශ්න ඇසීම සඳහා අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී. එහිදී නීතිඥවරයා සඳහන් කරන ලද්දේ, පෙරදී 2020.04.20 ප්‍රකාශය ලබා දුන්නේද නීතිඥවරුන් කරන ලද ඉල්ලීමකදී බවයි.  සාක්ෂිකරුව අධිකරණයෙන් ඉවතට යවන ලදී. මෙහිදී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා සඳහන් කරන ලද්දේ 2020.03.20 දින සාක්ෂිකරු ප්‍රකාශයක් කළ බවට මේ වන තෙක් උපදෙස් ලැබී නොමැති බවයි. සියලු කරුණු අනුව එවැනි ප්‍රකාශයක් ඇත්නම්, සහතික පිටපත් පැමිණිල්ලට, විත්තිකරුට සහ අධිකරණයට එවන ලෙස දන්වා සිටී. එවැනි ප්‍රකාශයක් තිබේ නම්, වැඩිදුර හරස් ප්‍රශ්න ඇසීමට දෙන බවට විනිසුරුතුමිය පවසන ලදී.

2020.04.20 කටඋත්තරය ලබා දුන්නේ ගෙදරට ටිකක් එහායින් යන්නද, 2020.04.21 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් සාක්ෂි ලබා දුන් බවද සාක්ෂිකරුගේ සාක්ෂි වලදී ප්‍රකාශ කෙරිණි.

දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා හරස් ප්‍රශ්න අසමින් , CCD එකට CID එකට දුන්න මාර්තු මාසයේ කටඋත්තරය ගැන කිවුවනේ, CID එකට 2020.04.20 ගෙදරදී කටඋත්තරයක් දුන්නා කියලා CID එකට කියන්න බාධාවක් තිබ්බද? යන්න විමසන ලදී. නැහැ යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී. ඒ අනුව 2020.04.20 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන්නා යන්න 2020.09.24 CCD හී ප්‍රකාශයේ සඳහන් නොකිරීම ඌනතාවක් ලෙස සටහන් කරන ලෙස දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ

මහතා ඉල්ලා සිටින ලදී. විනිසුරුතුමිය, එකී ප්‍රකාශයේ එවැනි කොටසක් නොමැති බවට නිරීක්ෂණය කරන බවට දැක්වීය. (එය මෙම නඩුවේ විමශර්නයට අදාළ ප්‍රකාශයක් නොවන බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ප්‍රකාශ කරයි.)

2020.04.20 ප්‍රකාශය දෙන ලද දිනට පසු දින CID එකට ගොස් ප්‍රකාශයක් දුන් බව CCD වෙත දෙන ලද ප්‍රකාශයේ සඳහන් කර නොමැති බව මෙම නඩුවට අදාළ ඌනතතාවක් යන්න හබ කරයි.

2020.04.20 දින සාක්ෂිකරු **CID**ය වෙත ලබා දුන් ප්‍රකාශයේ සාක්ෂිකරු අල්සුහයිරියා පාසලෙන් පැනයාම ඒ ආකාරයෙන් සඳහන් නොකිරීම ඌනතතාවක් ලෙස සටහන් කරයි. උදෑසන CID වෙත ගිය බව පවසන ලද්දේ නමුත් 2020.04.21 ප්‍රකාශයේ තිබෙන්නේ සවස 3යි ගාණක් බවයි. සාක්ෂිකරු එදින මතක් කරගෙන පැය කිහිපයක් ලබාදුන් කට උත්තරයේ පැනලා ගිය බව සඳහන් කිරීමට බාධාවක් නොමැති නමුත්, එම ප්‍රකාශයේ එවැනි වාක්‍ය කණ්ඩයක් නොමැති බව ඌනතතාවක්ය යන්න ලකුණු කරයි.

මෙම අධිකරණයේදී අල්සුහයිරියා පාසලෙන් පැනලා ගිය බව පැවසූ නමුත් 2020.04.21 **CID**ය වෙත ලබාදුන් ප්‍රකාශයේ සඳහන් වනුයේ පැනලා යන්න බැරි වුණා කියලනේ යන අදහස සහිතව ප්‍රශ්න කළ විට ඔව් යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී.

සාක්ෂි ආඥා පනතේ 145 වගන්තිය ද , අපරාධ නඩු විධාන සංග්‍රහයේ 110 වගන්තියද අධිකරණයේදී සඳහන් විය.

2020.05.12 දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රකාශයේදී සාක්ෂිකරු පාසලෙන් පැනයාම ගැන වාක්‍ය කණ්ඩයක් ඇතුලත්ව නොමැති අතර, එය ඌනතතාවක් ලෙස සටහන් කරයි.

2020.04.21 **CID**ය වෙත ලබාදුන් ප්‍රකාශයේ 2019 පෙබරවාරි වල නිදහස් උත්සවය සඳහා නිවාඩුවට ගෙදර ඇවිත් ආපසු නොගිය බවට සඳහනක් වන බවටද දක්වයි.

20 වන දින කටඋත්තරය ගන්නා ලද අවස්ථාවේ නම් කියමින් අහවල් එක්කෙනා දන්නවාද කියා විමසූ බව සාක්ෂිකරු දක්වන ලදී.

හිස්බුල්ලා සහ මවුලවී ගැන ඇසීමට CID යෙන් දෙපාරක් පැමිණි බවටත්, මුලින්ම පැමිණියේ අප්‍රේල් 20 බවටත්, දෙවැනි වර පැමිණි දිනය මතක නොමැති බවටත් සාක්ෂිකරු දක්වන ලදී.

2020.05.12 දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී සාක්ෂිකරු ලබාදුන් ප්‍රකාශය ලබාදීමට නිවසේ සිට ගිය බවටත්, ඊට පෙර දින CIDයෙන් සිය මව වෙත දුරකථන ඇමතුමක් ලබා දී වාහනයක් එවන බවටත්, උසාවියට පැමිණෙන ලෙසටත් පවසා ඇති බවට සාක්ෂිකරු සඳහන් කරන ලදී. නඩුකාරයෙක් ඉදිරියේ ප්‍රකාශයක් ලබා දෙන්න වන බවට ඊට පෙර පවසා නොතිබූ බවටත් ඔහු සඳහන් කරන ලදී.

මැයි 12ට කලින් අප්‍රේල් 20 සහ 21 කටඋත්තරයට පසුව CID යට තව ප්‍රකාශයක් දී තිබේද යන්න විමසූ කල්හී, එය මතක නැති බවට සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී.

තවදුරටත් හරස් ප්‍රශ්න හමුවේ පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ, හිස්බුල්ලාගේ නම දැනන් නොසිටි බවත්, හැඩරුව විතරක් දැන සිටි බවත්, හැඩරුව මුලින් විමසා හිස්බුල්ලාගේ ඡායාරූපයක් පෙන්වූ බවත්, අනිත් ඇයගේ නම් දැනන් සිටි බවත්ය.

හිස්බුල්ලා පාසලේ පැමිණ කරපු, කියපු දෑ 2020.04.20 ප්‍රකාශයේ සඳහන් නොකළ බවට සාක්ෂිකරු පිළිගන්නා ලදී.

අල්සුහයිරියා පාසලට කාන්තාවන් දෙදෙනෙක් දේශනයක් දීමට පැමිණි බවටත්, එම දෙදෙනා පැමිණියේ කළුපාට ඇඳුමක් ඇදන් බවටත්, එම කාන්තාවන් දෙදෙනා සාක්ෂිකරු සිටියදී පැමිණියේ එකපාරක් බවටත්, එක් කාන්තාවකගේ නම ලතීෆා බවටත්, එම කාන්තාවන් දෙදෙනා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බව දැනගත් බවටත් අදාළ විමසීම් මෙදින අධිකරණයේදී සිදු කරන ලදී. 2020.04.20 දින එම කාන්තාවන් දෙදෙනාගේ පින්තූර පෙන්නුවේද යන්න විමසූ කළ සාක්ෂිකරු මතක නොමැති බව පවසන ලදී.

නඩු තීන්දුවක් ද දක්වමින් ඡායාරූප පෙන්වා සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කිරීමට විත්තියේ නීතිඥ මහතා උත්සහ ගත් නමුත් ඒ සඳහා මෙදින අධිකරණයේ අවසර නොලැබිණි. මෙහිදී 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ විධිවිධාන පනත ප්‍රකාරව නොතීසි ලබා දීමක් සිදුකර නොතිබුණි. අදාළ ඡායාරූප ඉලෙක්ට්‍රොනික හා යාන්ත්‍රික ආකාරයෙන් ලබාගත් බව දෙපාශර්වයම පිළිගනී.

මෙම ඡායාරූප මත ප්‍රශ්න කිරීමට බලාපොරොත්තු වූ බැවින් දෙවන චූදිත සම්බන්ධයෙන් වැඩිදුර හරස් ප්‍රශ්න ඇසීමේ හැකියාවක් නොමැති බැවින් අඩාලව කල් දමන ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 2 තාවකාලිකව මුදා හරින ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 වර්ෂයේ ජනවාරි 23, මාර්තු 24, මාර්තු 27, මාර්තු 28 වැඩිදුර විභාගය සඳහා නියම කරන ලදී.

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

- https://www.dailymirror.lk/breaking_news/Hejaaz-Hizbullah-Case-Witness-admits-he-took-contradictory-stances/108-249349
- https://twitter.com/hejaazh/status/1596127025281916928?cxt=HHwWgICj5dTEyqYsAAAA
- https://twitter.com/hejaazh/status/1596062335684288512?cxt=HHwWgIC93Z2PraYsAAAA
- https://www.virakesari.lk/article/141311